# සිදු කළ හැකි ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ පිළිබඳ සංක්ෂිප්ත සහ විස්තරාත්මක නොවන විවරණයක්

ශ්‍රී ලංකාවේ මලයහ දමිළ ප්‍රජාවන් විසින් මුහුණ දෙනු ලබන ගැටළු

ආමන්ත්‍රණය කරමින්

වඩා පුළුල් ප්‍රතිපත්ති සාකච්ඡාවක් සඳහා මූලික රාමුව

CPA

Centre for Policy Alternatives

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින්

2023 ජූලි

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීනල දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරනල විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව
දුරකථන : +9411 2081384, +94112081385, +94112081386
ෆැක්ස්: +9411 2081388 විද්‍යුත් තැපෑල : info@cpalanka.org
වෙබ් අඩවිය : www.cpalanka.org
විද්‍යුත් තැපැල් ලිපිනය : info@cpalanka.org
මුහුණු පොත් පිටුව : www.facebook.com/cpasl
ට්විටර්: @cpasl

## පටුන

හැඳින්වීම

හැඳින්වීම ..... 4
අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ..... 5
ප්‍රධාන ගැටළු ..... 5
ප්‍රතිපත්ති (අඩුපාඩු) යාත්මක කිරීමේ හිඩැස්ක් / ..... 7
පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග ..... 9
නිවාස අර්බුදය ..... 11
ප්‍රධාන ගැටළු ..... 11
ප්‍රතිපත්තිය (අඩුපාඩු) යාත්මක කිරීමේ හිඩැස්ක් / ..... 12
පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග ..... 13
ප්‍රධාන ගැටළු ..... 15
ප්‍රතිපත්තිය (අඩුපාඩු) යාත්මක කිරීමේ හිඩැස්ක් / ..... 17
පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග ..... 18
වතු සේවකයින් සහ අවිධිමත් සේවකයින් ..... 19
ප්‍රධාන ගැටළු ..... 19
ප්‍රතිපත්ති /ක්‍රියාත්මක කිරීමේ හිඩැස් (අඩුපාඩු) ..... 20
පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග ..... 21

## හැඳින්වීම

මලයහ දමිළ ප්‍රජාවගේ (කඳුරට දෙමළ) අයිතිවාසිකම් සම්බන්ධයෙන් සකස් කළ යුතු වන ප්‍රතිපත්ති සහ පිළිවෙත් ආශ්‍රිත මැදිහත්වීම් සඳහා අදාල වන අභියෝග හා පුළුල් යෝජනා මෙන් ම ඒ ආශ්‍රිතව පවත්නා ප්‍රමුඛ පෙළේ ගැටළු අවධාරණය කිරීම උදෙසා මෙම සංක්ෂිප්ත ලේඛනය පිළියෙල කරනු ලැබේ. මෙම විෂය පුළුල් සහ සංකීර්ණ ගැටළුවක් වන අතර, ඒ සඳහා අනිවාර්යයෙන්ම සිදු කල යුතු නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා මැදිහත්වීම් හඳුනාගැනීම උදෙසා ප්‍රජාව සමඟ වඩා පුළුල් සහ අර්ථාන්විත සාකච්ඡාවන් සිදුකිරීම අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ. කෙසේ වුවද, මෙම දිශානතිය ඔස්සේ ප්‍රතිපත්ති සංවාදයක් ආරම්භ කිරීම උදෙසා, නව ප්‍රතිසංස්කරණ සිදු කිරීම හෝ දැනට පවත්නා නීති සහ ප්‍රතිසංස්කරණ සාධනීය ආකාරයෙන් ක්‍රියාවට නැංවීම අවශ්‍ය වන වඩා පුළුල් සහ විභව ක්ෂේත්‍ර අවබෝධ කර ගැනීමට සහ ලේඛනගත කිරීමට අපේක්ෂා කරනු ලැබේ. එම නිසා, මෙම ලේඛනය මලයහ දමිළ ප්‍රජාව (කඳුරට දෙමළ) සඳහා මෙම රට තුළ සමාන පුරවැසියන් වශයෙන් සම හිමිකම් ලබා දීමට කටයුතු කිරීමේදී මුහුණ දෙනු ලබන ගැටළු පිළිබඳ විස්තරාත්මක නොවන විශ්ලේෂණයකි.

වර්තමානයේ මලයහ දමිළ වශයෙන් හඳුනාගැනීමට ලක් වන (එසේම කඳුරට දමිළ, ඉන්දියානු දමිළ, වතු දමිළ, උඩරට දමිළ වශයෙන්ද හඳුන්වනු ලබන) , ශ්‍රී ලංකාවේ මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත් වල ප්‍රමුඛවම ජීවත් වන විශේෂයෙන්ම දෙමළ භාෂාව කතා කරනු ලබන කඳුරට දමිළ ජනතාව බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේදී ශ්‍රී ලංකාවට පැමිණි ඇපයෙන් බැඳී සිටින කම්කරුවන්ගෙන් පැවත එන්නන් වේ. නිදහස ලැබුණු වහාම පුරවැසි පනත හඳුන්වා දීම තුලින් මෙම ප්‍රජාවට ස්වකීය පුරවැසි හිමිකම් අහිමි කළ අතර, ඔවුන් ප්‍රධාන ප්‍රවාහයට අයත් සියලු ස්වරූපයේ සංවර්ධන ක්‍රියාවලීන්ගෙන් බැහැර කිරීමට ලක් කිරීම සිදු විය. පුරවැසිභාවයක් නොමැතිවීමේ ගැටළුව 2003 වර්ෂයේදී නීතිමය වශයෙන් විසඳීමක් සිදුවූ නමුත්, රටෙහි අනෙකුත් ප්‍රජාවන් සමග සංසන්දනය කිරීමේදී ඉතා අඩු සමාජ ආර්ථික සංවර්ධනයක් ඇති වීමට තුඩු දෙමින් සංවර්ධන, ආණ්ඩුකරණ සහ දේශපාලන පැතිකඩ තුළ ව්‍යුහාත්මක බැහැර කිරීම අඛණ්ඩවම පවතී. වැවිලි ආශ්‍රිත ප්‍රදේශ වල ජීවත් වන ප්‍රජාවගෙන් බහුතරයක් මලයහ දමිල ජාතිකයන් වේ.

තේ, රබර්, පොල් හෝ ඔයිල් පාම් වගා කරනු ලබන වතු වල ජීවත් වන නේවාසික කම්කරුවන් සිටින මධ්‍යම, ඌව, සබරගමුව, දකුණ, බස්නාහිර, උතුරු මැද සහ වයඹ පළාත් වලට අයත් දිස්ත්‍රික්ක තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ යටතේ පවත්නා ප්‍රදේශ වශයෙන් "වැවිලි කලාපය" අර්ථ නිරූපනය කොට ඇත. ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2011 වසරේ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 4.4% ක් නොඑසේ නම් 901,647 දෙනෙක් වතු ක්ෂේත්‍රය තුළ ජීවත් වනු ලැබේ.

වසර ගණනාවක් තිස්සේ, මලයහ දමිල ප්‍රජාව ශ්‍රී ලංකාව තුළ පූර්ණ සහ සමාන පුරවැසිභාවය අත්පත් කර ගැනීම සඳහා අඛණ්ඩ සටනක නිරත වී ඇත. රටෙහි ආර්ථික සෞභාග්‍යය උදෙසා තමන් විසින් සිදු කරන සැලකිය යුතු දායකත්වය මධ්‍යයේ දේශපාලනය, ආණ්ඩුකරණය සහ ආර්ථික සංවර්ධනය වැනි ක්ෂේත්‍රයන් තුළදී තමන්ට සමාන සහ පූර්ණ පුරවැසියන් වශයෙන් සලකනු නොලබන බව මෙම ප්‍රජාවට දීර්ඝ කාලයක් තිස්සේ දැනී ඇත.

1823 වසරේ වැවිලි ක්ෂේත්‍රය ආරම්භ කිරීමෙහි සිට එනම්, පසුගිය වසර 200ක පමණ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ සුභසෙත වෙනුවෙන් ඉතා විශාල වශයෙන් දායකත්වය සලසා ඇති මලයහ දමිළ ජනතාව විශේෂිත ප්‍රතිපත්තිමය ආරක්ෂාවක් නොමැති වීම නිසා හෝ උදාසීන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම හේතුවෙන් මර්ධනයට ලක් වී ඇති ප්‍රජාවක් වශයෙන් සැලකිය හැකි අතර ඒ හේතුවෙන් කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන නීති සම්පාදන, ප්‍රතිපත්ති සහ පිළිවෙත් ආශ්‍රිත ධනාත්මක ක්‍රියාමාර්ග ඔස්සේ ස්වකීය හිමිකම් පාදක ගැටළු උදෙසා කටයුතු කරනු ලැබේ.

# අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය

අභිමතාර්ථය: *සේවා ස්ථාන ආශ්‍රිත සූරාකෑමට ලක් වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම කෙරෙහි කේන්ද්‍රීය වෙමින් වැවිලි ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය සහතික කිරීම උදෙසා ප්‍රතිපත්ති නිර්මාණය කිරීම.*

## ප්‍රධාන ගැටළු

- ⇨ මලයහ හා දමිල ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරනු ලබන සහ ඔවුන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කරනු ලබන පුළුල් ප්‍රතිපත්තිමය සහ වැඩසටහන්මය ආරක්ෂක රාමුවක් සංවර්ධනය කිරීම සඳහා අදාල වන මූලික පූර්ව අවශ්‍යතාවයක් වන්නේ වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව සිටින මෙම ප්‍රජාවගේ අද්විතීය අනන්‍යතාවය හඳුනාගැනීමට ලක් කිරීමයි.

- ⇨ මලයහ දමිළ ප්‍රජාවන් පිළිගැනීමට ලක් වන තත්ත්වයක් යටතේ වුවද, මෙරටෙහි පුරවැසියන් වශයෙන් වන නීතිමය අරුත් ගැන්වීමෙහි තාක්ෂණික නිර්වචනය තුළ, ප්‍රායෝගිකව සලකා බැලීමේදී මලයහ දමිළ ප්‍රජාවේ සාතිශය බහුතර සාමාජිකත්වය සඳහා ඉහත කී නෛතික තත්ත්වය "ක්‍රියාකාරී සහ සමාන පුරවැසිභාවය" වශයෙන් අර්ථාන්විතව පරිවර්තනය වී නොමැත. මෙම ප්‍රජාවන් ඡන්දදායකයන් වශයෙන් හුදෙක් ලියාපදිංචි කරවනු ලැබීමත් එසේම මැතිවරණ වලදී ඡන්දදායකයන් වශයෙන් සැලකීමත් සිදු වුණද, අනෙකුත් ප්‍රජාවන් හා සමාන පදනමක් මත රාජ්‍ය සේවය වෙත ප්‍රවේශ වීම සහ පුළුල් පරාසයකට අයත් සමාජ ආර්ථික සහ අනෙකුත් හිමිකම් භුක්ති විඳීම තුළදී ඔවුන් අඛණ්ඩවම බැහැර කිරීමට ලක් වීමත්, වෙනස් කොට සැලකීමට ලක් වීමත් සිදු වේ.

- ⇨ මෙම බැහැර කිරීම සඳහා හේතු වන්නේ මුල් බැසගත් සමාජ සම්මතයන් පමණක් නොවන අතර, පිළිවෙලින් බලයට පත් වූ රජයන් විසින් අනුගමනය කරන ලද වගකීම් විරහිත ආණ්ඩුකරණ ක්‍රම ද ඔවුන් මෙම රටෙහි පුරවැසියන් වශයෙන් හඳුනාගැනීමට ලක් කිරීම උදෙසා අවශ්‍ය වන අව්‍යාජ දේශපාලන උවමනාව පෙන්නුම් කොට නොමැත.

- ⇨ වතු කළමනාකාරිත්වයන් විසින් තමන්ට පවත්නා ගිවිසුම්ගත වගකීම්ද නොසලකා හරිමින් බොහොමයක් සුභසාධන ප්‍රතිපාදන සැපයීම් නවතා දමා ඇත. සනීපාරක්ෂාව, නිවාස, පිරිසිදු සහ ආරක්ෂිත පානීය ජලය සහ අනිකුත් පහසුකම් වලට අදාල අවම ප්‍රමිතියක් වෙත පවා ප්‍රවේශයක් නොපවතී. රජය, වෘත්තීය සමිති, ප්‍රජා නියෝජිතයන් සහ වතු සමාගම් අතර විවෘත සාකච්ඡා නොමැති වීම තුලින් මලයහ දමිල ප්‍රජාවගේ වෙනස් කොට සැලකීම් සහිත ජීවන තත්ත්වයන්හි අවදානම ඉහළ නංවා ඇත. මෙවන් මර්ධනයකට අභියෝග කිරීම සඳහා සේවකයන් හට සමාජ සම්බන්ධතා, මුදල් බලය, අධ්‍යාපනය සහ ආත්ම අභිමානයක් නොමැති වීම හේතුවෙන් වතු කළමනාකාරිත්වය ඇතුළු බලධාරීන් හට කිසිදු තැකීමකින් තොරව මෙම ගැටළුව අඛණ්ඩවම නොසලකා හරිමින් සිටීමට හැකි තත්ත්වයක් නිර්මාණය කොට ඇත.

- ⇨ ආන්තිකකරණය, වෙනස් කොට සැලකීම, සූරා කෑම් සිදු වන සේවා කොන්දේසි සහ පරතෙරක් නොපෙනෙන ගැටළු සහිත ජීවන තත්ත්වයන් හේතුවෙන් මලයහ දමිළ ප්‍රජාව ඕනෑවටත් වඩා බලපෑමට ලක් වී සිටී. පහත වගුව මගින් 2016-19 කාල වකවානුව අතරතුර අනෙකුත් ප්‍රජාවන් හා සංසන්දනාත්මකව මෙම ප්‍රජාවගේ තත්ත්වය පෙන්නුම් කරනු ලැබේ. කෙසේ වුවද, වඩා බරපතල බලපෑමකට ලක් වූ එක් පාර්ශ්වයක් වශයෙන් මලයහ දමිළ ප්‍රජාව සැලකිය හැකි, කොවිඩ් 19 වසංගතය සහ ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදය යන සංදර්භයන් තුළ මොවුන් මුහුණ දෙන තත්ත්වයේ බරපතලකම වඩා මෑතකාලීන සහ නිවැරදි සංඛ්‍යා මගින් පෙන්නුම් කරනු ලැබේ. මෙම ප්‍රජාවගේ සමාජ ආර්ථික සහ දේශපාලනික වැඩි දියුණුව කෙරෙහි බාධා ඇති කරනු ලබන නෛතික සහ ප්‍රතිපත්තිමය රාමු තුළ ඇති අවහිරතාවයන් පිළිබඳ අව්‍යාජ තක්සේරුවක් සිදු කිරීමේ අවශ්‍යතාවය මේ තුලින් පෙන්නුම් කරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ මෙම ප්‍රජාවන් විසින් මුහුණ දෙනු ලබන දීර්ඝකාලීනව පවත්නා ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා විශේෂිත ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග, වගකිව යුතු

ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ, වගකීම් සහගත පරිපාලන රාමු, යෝග්‍ය ධනාත්මක ක්‍රියාමාර්ග ආදිය අවශ්‍ය වේ. බලපෑමට ලක් වූ ප්‍රජාවන් සහ පාර්ශ්වකරුවන් සමග සාකච්ඡාමය ස්වරූපයෙන් සහ ප්‍රවේශම් සහගත අයුරින් මේවා නිර්මාණය කළ යුතුය.

වගුව 1 - වතු ක්ෂේත්‍රය තුළ සමාජ ආර්ථික තත්ත්වය සංසන්දනය කිරීම - 2016-2019

| දර්ශක | ජාතික | නාගරික | ග්‍රාමීය | වතු |
|---|---|---|---|---|
| ප්‍රධාන ආදායම් මූලාශ්‍රය අනුව මාසික ආදායමේ සාමාන්‍යය (වැටුප් සහ වේතන) (රු.) | - | 43226 | 25443 | 39,195 |
| මසකට මධ්‍යන්‍ය කුටුම්භ ආදායම (රු.) (2019) | 76414 | 116670 | 69517 | 46865 |
| මසකට මධ්‍යන්‍ය ඒකපුද්ගල ආදායම (රු.) | 20527 | 30452 | 18870 | 11647 |
| ආදායම් ලබන්නාගේ මසක මධ්‍යන්‍ය ආදායම (රු.) | 42308 | 61426 | 39324 | 22469 |
| කුටුම්භය තුල සිටින ආදායම් ලබන්නන් සංඛ්‍යාව (%) | 1.8 | 1.9 | 1.8 | 2.0 |
| කුටුම්භයේ ප්‍රමාණය (%) | 3.8 | 4 | 3.8 | 4.1 |
| මසකට මධ්‍යන්‍ය කුටුම්භ වියදම (රු.) | 63130 | 95392 | 57652 | 38519 |
| දරිද්‍රතා මට්ටමේ සිටින පුද්ගලයින් සංඛ්‍යාව (%) (2019) | 11.9 | 4.4 | 12.6 | 29.7 |
| අංශ අනුව ප්‍රතිශතයක් වශයෙන් දරිද්‍රතාවය (2019) | 14.3 | 6.0 | 15.0 | 33.8 |
| සේවා වියුක්තිය (%) | 4.4 | 4.0 | 4.5 | 3.1 |
| ණය ගැති කුටුම්භ ප්‍රතිශතය (%) | 59.7 | 52.9 | 60.9 | 64.4 |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය (%) | 6 | - | - | 0.3 |
| නිවසක් හිමි ජනගහනය (%) | 83.7 | - | 90.4 | 5.6 |
| තනි ඒකක ස්වරූපයේ නිවාස | 5.3 | 93.9 | 98.5 | 40.8 |
| සිවිල් සේවය තුල නියෝජනය (%) | 22% | - | - | 1.1 |
| සාක්ෂරතාවය (%) | 93.1 | 95 | 93 | 85 |
| පරිගණක සාක්ෂරතාවය (%) | 21.6 | 35 | 19.9 | 6 |
| පිරිසිදු ජලය වෙත ප්‍රවේශය සහිත පුද්ගල ප්‍රමාණය (%) | 82.8 | - | 84.3 | 55.1 |
| වැසිකිලි භාවිතා නොකරන කුටුම්භ ප්‍රමාණය (%) | 1.7 | 0.2 | 1.8 | 4.6 |

| | | | | |
|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතය (සජීවී උපත් 100ක් සඳහා ) (%) | 9.7 | - | - | 29 |
| අඩු බර දරුඋපත් (%) | 16.6 | - | - | 31 |
| යම් මට්ටමක ආහාර සුරක්ෂිත නොවන | - | 31.9 | 34.9 | 41.3 |
| දැඩි ලෙස ආහාර සුරක්ෂිත නොවන | - | 2.1 | 1.1 | 2.1 |
| වයස අවුරුදු 5ට අඩු කුරු වර්ධනයක් සහිත ළමයින් ප්‍රමාණය (%) | 18 | - | - | 40.8 |

- ⇨ දශක දෙකක් තිස්සේ වතු ක්ෂේත්‍රය තුළ සෞඛ්‍ය සේවා සැපයීම ආශ්‍රිතව ඉතා පැහැදිලි ව්‍යුහාත්මක සහ ආයතනික වශයෙන් බැහැර කිරීමක් පැවතී ඇත. වර්තමානයේ සෞඛ්‍ය පද්ධතිය කළමනාකරණය කරනු ලබන්නේ ජාතික සහ පළාත් සෞඛ්‍ය අධිකාරීන්ගෙන් බැහැර වෙමින් වැවිලි සමාගම් විසින් වන අතර ඒවායේ වගවීමක් නොමැතිවීම හේතු කොට ගෙන ඉතා පුළුල් නොසලකා හැරීමක් කෙරෙහි තුඩු දෙන තත්ත්වයක් නිර්මාණය වී ඇත.

- ⇨ මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ළදරු මරණ අනුපාතය, මාතෘ මරණ අනුපාතය, මන්දපෝෂණය සහ අනෙකුත් සෞඛ්‍ය දර්ශක කණගාටුදායක තත්ත්වයක පවතී. ළදරු මරණ අනුපාතය යනු කිසියම් සමාජයක හෝ රටක පවත්නා සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ මනා දර්ශකයකි. ඒ අනුව සැලකූ විට කලාපීය වශයෙන් ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය දර්ශක සාමාන්‍යයන් පිළිගත හැකි මට්ටමක පවතින නමුත් වැවිලි අංශය තුළ ඉහළ ළදරු මරණ අනුපාත පවතී.

## ප්‍රතිපත්ති / ක්‍රියාත්මක කිරීමේ හිඩැස් (අඩුපාඩු)

- 1823 වසරේ සිට ශතක දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය, සංවර්ධනය සහ ගෙවුම් ශේෂ සඳහා අති විශාල දායකත්වයක් සලසන ලද, වැවිලි ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන මලයහ දමිළ ප්‍රජාවක් වෙත **පිළිගැනීමක් නොමැති වීම**

- නිදහස ලැබීමෙන් පසු සැලකිය යුතු කාල වකවානුවක් තුළ මෙම ප්‍රජාවට ස්වකීය පුරවැසිභාවය, සංවර්ධන අවස්ථා සහ දේශපාලන නියෝජනය යනාදී අවස්ථා අහිමි ව තිබුණු බවට වන කාරණය සඳහා **දේශපාලනික වශයෙන් වැදගත්කමක් හෝ පිළිගැනීමක් ලබා දී නොතිබීම** සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රජාවන් හා සංසන්දනය කිරීමේදී බොහොමයක් සමාජ ආර්ථික හා මානව සංවර්ධන දර්ශක අනුව පසුපසින් සිටීම.

- විශේෂිත අනන්‍යතාවයක් සහිතව සමස්ත ශ්‍රී ලාංකීය අනන්‍යතාවයට දායකවන, ඡන්දදායක ප්‍රජාවක් වශයෙන් ස්වකීය හිමිකම් සහ අභිමානය පූර්ණ වශයෙන් භුක්තිවිඳිනු ලබන සමාන පුරවැසියන් වශයෙන් සලකනු ලැබීමට තමන් සතු අයිතිය සහතික කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීම

- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වන පනතක් වන 2018 අංක 30 දරණ ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත **සාධනීය ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමක් සිදු නොවීම.** මූලික ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය 3(2) වගන්තිය " *වැවිලි ප්‍රදේශ සම්බන්ධයෙන් වන විට, ප්‍රාදේශීය සභාව විසින්, විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසුව, සහ අදාල වත්තෙහි පාලනාධිකාරිය විමසා, අදාල වැවිලි ප්‍රදේශ වල පදිංචිකරුවන්ට අවශ්‍ය පාරවල්, ළිං සහ එම*

*පදිංචිකරුවන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය වන වෙනත් පොදු පහසුකම් ලබා දීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදල උපයෝගී කර ගනු ලැබිය හැකිය.“*

- ස්වකීය සුභසාධනය සලසා දෙනු ඇතැයි වතු ප්‍රජාවන් විසින් විශ්වාසය තබන පෞද්ගලික සමාගම් මගින් දශක ගණනාවක් තිස්සේ නොසලකා හැරීමට ලක්වී ඇති වතු ප්‍රජාවන්ගේ අවශ්‍යතා සහ දුක් ගැනවිලි ආමන්ත්‍රණය කිරීම සඳහා වන ජාතික කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියක් වන මහවැලි අධිකාරිය හා සමානවම වතු ක්ෂේත්‍රයේ සිටින ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම සඳහා රජයේ අධිකාරියක් වශයෙන් ස්ථාපිත කරන ලද 2017 අංක 32 දරණ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත **සාධනීය අයුරින් ක්‍රියාවට නැංවීමක් සිදු නොවීම**. මෙම ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු හේතුවෙන් එකී පනතේ අභිමතාර්ථ බරපතල ලෙස අහෝසි වී ඇත.

- එවන් නෛතික රාමු ක්‍රියාවට නංවනු ලබන ආකාරය පිළිබඳ **නිසි අධීක්ෂණයක් සහ සමාලෝචනයක් නොමැති වීම** තුලින් මලයහ දමිළ ප්‍රජාවන් දිගු ගැස්සෙමින් පවත්නා මර්ධනයෙහි වින්දිතයන් වශයෙන් සිටීම දිගින් දිගටම සිදු වන දීර්ඝකාලීන සමාජ සැකැස්ම තුළ කිසිදු වෙනසක් ඇති කරනු නොලැබේ. අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම සඳහා උදාහරණ වශයෙන් අර්ථාන්විත අරමුණක් සහිතව 2017 අංක 32 දරණ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත ක්‍රියාවට නැංවීම දුර්වල තත්ත්වයේ පවතී. අධිකාරියේ අභිමතාර්ථ විය යුත්තේ - *(අ) වැවිලි කලාපයේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් නම් කළ ප්‍රදේශ වල වැවිලි ප්‍රජාව ප්‍රධාන සමාජ ධාරාවට ඇතුලත් වීම සහතික කිරීම, සහ (ආ) නම් කළ ප්‍රදේශ වල වැවිලි ප්‍රජාව ඔවුනට ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි පරිදි සමාජමය හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම*

- මෙම ප්‍රජාවගේ ආර්ථික කටයුතු නිසි වගවීමක් සහිතව කළමනාකරණය කිරීම සඳහා අදාල පළාත් සභාවන්ට හැකියාව ඇති වන පරිදි යෝග්‍ය අවස්ථාවලදී සෞඛ්‍ය සේවාවන් ජාතික සහ යෝග්‍ය පරිදි ප්‍රධාන වශයෙන් ම පළාත් සෞඛ්‍ය පද්ධතිය සමග ඒකාබද්ධ කරනු ලබන බව සහතික කිරීම සඳහා **ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමක් නොමැති වීම**. වර්තමානය වන විට, පවුල් 250,000කින් සමන්විතව රට පුරා වතු 412ක් පවතී. එසේම මේ වන විට, පළාත් සෞඛ්‍ය පරිපාලනය යටතට පත් කොට ඇත්තේ වතු රෝහල් 61ක් පමණ වන අතර අනිත් රෝහල් තවමත් වතු කළමනාකාරිත්වය යටතේ පවතී.

- මලයහ දමිළ ප්‍රජාවන්ට නිසි ආකාරව ප්‍රවේශ වීමට සහ ප්‍රතිලාභ සලසා ගැනීමට හැකි වන ශක්තිමත් පළාත් මට්ටමේ සෞඛ්‍ය පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා **දේශපාලන කැමැත්තක් නොමැති වීම**. වැවිලි කලාප ලෙස නම් කරන ලද ප්‍රදේශ තුළ පලාත් රාජ්‍ය යාන්ත්‍රණයක් සමාන අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා අනුප්‍රාප්තික රජයන් පාර්ශ්වයෙන් දැක්වූ නොසැලකිල්ල මේ තුලින් පෙන්නුම් කෙරේ.

- වැවිලි අංශය තුළ ප්‍රධාන ධාරාවේ පරිපාලන රාමුවට රාජ්‍ය සේවාවන් **ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාවලියක් නොමැති වීම** සැලකිය යුතු අවධානයක් යොමු විය යුතු කරුණක් වන අතර, සමාන අධ්‍යාපනයක් සඳහා අවස්ථා සපයමින් සමාජය සවිබල ගැන්වීම, ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් සැලසීම, ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සහ තමන් කැමැත්ත දක්වන භාෂාවෙන් ස්වකීය සේවාවන් සපයා ගැනීම සඳහා පහසුකම් සැලසීම

- වැවිලි අංශයට අයත් සියලු පවුල් සඳහා වෙන් වෙන් වශයෙන් ‘තැපැල් ලිපින‘ සැපයීම සහතික කිරීම සඳහා **පරිපාලනමය ක්‍රියාමාර්ග දක්නට නොලැබීම**. පෞද්ගලික ලිපි හුවමාරු වලදී ඒවා වතු කළමනාකරණ නිලධාරීන් වෙත භාර දීම දැනට පවත්නා අවමන් සහගත ක්‍රියාවලිය වන අතර, එම තත්ත්වය යටතේ අදාල සන්නිවේදනයන්හි ආරක්ෂිත භාවය පිළිබඳ කිසිදු වගවීමක් නිර්මාණය නොවේ. තවදුරටත් නොසලකා හැරීම සහ අවභාවිතාවට ලක් වීම සඳහා ඉඩකඩ නිර්මාණය වන වෙනස් කොට සැලකීමකින් යුතු මෙම ක්‍රියා පිළිවෙත වෙනස් කිරීමට හැකියාව පවතින අතර එය අනිවාර්යයෙන් එසේ වෙනස් කළ යුතුය.

- සිවිල් පරිපාලනය, සංවර්ධන වැඩසටහන් හෝ වතු කළමනාකරණ බලතල සීමාවන් තුළට **ප්‍රතිපත්තිමය නිර්දේශ ඒකාබද්ධ කිරීමක් සිදු නොවීම**. ජල සැපයුම, ජලාපවාහන පහසුකම්, වැසිකිලි පහසුකම්, සංවර්ධිත මාර්ග ජාල සහ ප්‍රවාහන පහසුකම් ආදී මූලික සේවාවන් ද මෙම වතු ප්‍රජාවන් හට නොපවතී. වතු කළමනාකාරිත්වය හෝ ජල සම්පාදන මණ්ඩලය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හෝ අදාල දේශීය රජයේ ආයතන වැනි අදාල රාජ්‍ය ආයතන විසින් මෙම ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා හෝ දැනට පවත්නා සේවාවන් හි තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා හෝ අවශ්‍ය මුලපිරීම් සිදු කොට නොමැත. රටෙහි අනෙකුත් ප්‍රජාවන් හා සමානවම න්‍යායාත්මක වශයෙන් මලයහ දමිල ප්‍රජාවටද නෛතික හිමිකමක් පවත්නා රාජ්‍ය සේවා බොහොමයක් ආශ්‍රිත කාරණා පිළිගත හැකි මට්ටමින් සිවිල් පරිපාලනය තුළට හෝ රට තුළ පවත්නා සිවිල් සමාජ සංවිධාන හෝ සංවර්ධන වැඩසටහන් තුළට නිසි අයුරින් ඒකාබද්ධ කොට නොමැත.

## පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග

1. වැවිලි කලාප වල සිටින මලයහ දමිළ ප්‍රජාවට තමන් තෝරා ගනු ලබන භාෂාවකින් රාජ්‍ය සේවාවන් සලසා ගැනීමට හැකියාව සහ ඒ සඳහා වන ප්‍රවේශය පවතින බවට සහතික කරමින් විශේෂයෙන්ම නියමිත ද්වි භාෂා අංශ තුළ ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කරන ලද භාෂා හිමිකම් බලාත්මක කිරීම.

2. මෙම ප්‍රජාවගේ ජන විකාශන අංග ලක්ෂණ සැලකිල්ලට ගනු ලබන මැතිවරණ ක්‍රියා පටිපාටි ආශ්‍රිත සමානුපාතික ක්‍රමයක් සහ දේශපාලන බලය නිසි පරිදි බෙදා ගැනෙන තත්ත්වයක් සහතික කිරීම

4. වැවිලි ප්‍රදේශ වල සිටින පදිංචිකරුවන් හටද සමාන පුරවැසියන් පරිද්දෙන් පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් සපයන සියලු රාජ්‍ය සේවාවන් සඳහා වන සමාන ප්‍රවේශය සහතික කිරීම. එසේම, සාධාරණ සීමා නිර්ණය ප්‍රතිමාන හා සමගාමීව නව ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ස්ථාපිත කිරීම සඳහා වන රජයේ තීරණය ක්‍රියාත්මක කිරීම.

5. වැවිලි කලාප වල සිටින මලයහ දමිළ ප්‍රජාවට විශේෂයෙන්ම නියමිත ද්වි භාෂා අංශ තුළ ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කරන ලද භාෂා හිමිකම් බලාත්මක කිරීම සහ තමන් තෝරා ගනු ලබන භාෂාවකින් රාජ්‍ය සේවාවන් සලසා ගැනීමට හැකියාව සහ ඒ සඳහා වන ප්‍රවේශය පවතින බවට සහතික කිරීම.

6. මලයහ දමිල ප්‍රජාවගේ ආරක්ෂාව සහ සුභසාධනය සුරක්ෂිත කිරීම සඳහා සමාජ, ආර්ථික, දේශපාලනික සහ වෙනත් හිමිකම් පාදක අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීම සඳහා දීර්ඝකාලීන ජාතික සංවර්ධන සැලැස්මක් සැකසුම් කිරීම, ඒ සඳහා අවශ්‍ය සම්පත් සැපයීම සහ එය ක්‍රියාත්මක කිරීම

7. කවර හෝ සමාජ සුභසාධන වැඩසටහන් තුලදී රටෙහි වඩාත්ම දිළිඳු සහ ආහාර සුරක්ෂිතතාවය අතින් වඩාත්ම අනාරක්ෂිත ප්‍රජාව වශයෙන් තක්සේරු කරනු ලබන වැවිලි සේවකයන් සැලකිල්ලට ලක් කර ගැනීම. වැවිලි ප්‍රදෙශ වල පවත්නා උග්‍ර මන්දපෝෂණ තත්ත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා විශේෂ වැඩසටහන් හඳුන්වා දීම

8. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින්, අදාල ප්‍රාදේශීය සභා, පොලිසිය, තැපැල් දෙපාර්තමේන්තුව, මැතිවරණ කොමිෂන් සභාව සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමග සහයෝගිතාවයෙන් වැවිලි අංශය තුළ පවත්නා නිවාස පිළිබඳ පුළුල් සංගණනයක් ආරම්භ කිරීම සහ ඉන් අනතුරුව එක් එක් නිවස සඳහා තැපැල් ලිපිනයක් සැපයීම.

9. 2018 අංක 30 දරණ ප්‍රාදේශීය සභා (සංශෝධන) පනතේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගනු ලබන බවට සහතික කරමින් වැවිලි අංශය තුළ ජීවත් වන ජනතාවගේ සුභසාධනය සඳහා අවශ්‍ය වන මාර්ග, ළිං සහ අනෙකුත් පොදු පහසුකම් අදාල වැවිලි අංශවල වැසියන් හට ලැබෙන පරිදි එම පහසුකම් සැලසීම සඳහා ප්‍රාදේශීය සභා පනත භාවිතා කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම විශේෂිත අතුරු නීතියක් ආකාරයට සකස් කළ යුතු අතර, එයට අනුකූලව 'වැවිලි ප්‍රදේශ 'වශයෙන් නිර්වචනය කරනු ලබන අදාල

ප්‍රදේශවල තිබෙන ප්‍රාදේශීය සභාවන් සඳහා භාවිතා කරනු ලැබිය හැකි, සියලු අංශ වලට පොදුවේ අදාල වන බලාත්මක කිරීමක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කළ හැකිය.

10. එයට අමතරව, 2018 අංක 30 දරණ ප්‍රාදේශීය සභා සංශෝධන පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ සමාලෝචනයට ලක් කිරීම සඳහා යෝග්‍ය පරිදි, කොට්ඨාශ / ප්‍රාදේශීය මට්ටමින් -පළාත් පාලන ආයතන නියෝජිතයන්, වැව්ලි කළමනාකරණ ව්‍යුහ, රජයේ ආයතන සහ සිවිල් සමාජ නියෝජිතයන්ගෙන් සමන්විත සංසදයක් ස්ථාපිත කළ යුතුය.

11. පානීය ජලය සහ වැසිකිලි පහසුකම් පිළිබඳ ජාතික සාමාන්‍ය දර්ශක හා සමගාමී මට්ටමකට වැව්ලි ප්‍රජාව ගෙන ඒමේ අරමුණින් යුතුව ප්‍රමුඛතා පදනමක් මත රජයේ මූලිකත්වයෙන් සිදු කෙරෙන ජල සම්පාදන සහ සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම

12. පලාත්පාලන ආයතන, පලාත් සභා සහ මධ්‍යම රජයේ අමාත්‍යාංශ විෂයපථයන් තුළ පවත්නා ප්‍රදේශයන්හි මාර්ග පද්ධති වැඩි දියුණු කිරීම සහ ඒවා නිතිපතා නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම සිදු වන පරිදි ජාතික ප්‍රධාන ප්‍රවාහයට ඒවා ඒකාබද්ධ කිරීම.

# නිවාස අර්බුදය

අභිමතාර්ථය : වැවිලි ප්‍රජාවන්ට බලපාන නිවාස අර්බුදය සඳහා තිරසර විසඳුම් සොයාගැනීම

## ප්‍රධාන ගැටළු

- ⇨ නිවාස ගැටළුව යනු ශතවර්ෂ ගණනාවක් තිස්සේ වැවිලි අංශය තුළ මලයහ දමිළ ජනතාවගේ සුභසාධනයට ඉතා අහිතකර ලෙස බලපාන ලද බරපතල ගැටලු වලින් එකකි. වතු සේවකයන් සඳහා කම්කරු නිවාස වශයෙන් බ්‍රිතාන්‍ය යුගයේදී මුලින්ම ඉදි කරන ලද 10x10 පරිමාණයේ ලයින් කාමර පේලියක් තවදුරටත්, එනම්, ඔවුන්ගේ වාසස්ථාන බිහිවී ආසන්න වශයෙන් ශතක දෙකක් ගත වී ඇති තත්ත්වයක් තුළ පවා වතු ජනතාව අතර ප්‍රධාන නිවාස වර්ගය වශයෙන් තවදුරටත් පවතින අතර, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එවන් නිවාස පේලි පාවිච්චිය නිසාම අභාවයට පත් වී ඇත. නිවාස ආශ්‍රිත මෙම දුක්ගැනවිලි තවදුරටත් තීව්‍ර කරමින් බොහෝ අවස්ථාවලදී වතු කළමනාකාරිත්වය විසින් මේවාට අවශ්‍ය වන නඩත්තු කටයුතු සිදුකිරීම නොසලකා හැර කටයුතු කොට ඇත.

- ⇨ වැවිලි ක්ෂේත්‍රය තුළ ඉඩම් හිමිකම් නොමැති වීම හේතුවෙන් තමන් සතුව මුදල් තිබුණද තමාගේ විවාපත් දරුවන් සහ ඔවුන්ගේ දරුවන් සඳහා භාවිතා කළ හැකි පරිදි දැනට පවත්නා කම්කරු ලයින් කාමර නවීකරණය කිරීම හෝ පුළුල් කිරීම නොඑසේ නම් වෙනත් විකල්ප නිවාස ගොඩනගා ගැනීම යනාදියෙන් මලයහ දමිල ජනතාව වළක්වා ඇත. මෙම ප්‍රජාවගේ උපන් ස්ථානය මෙම වතු වීමත්, එසේම වගාවන් ගොඩනැගීම සහ ඒවා තිරසරව පවත්වා ගැනීම සඳහා ඔවුන්ට උරුම වූ භූමිකාවක් පැවතීමත් මධ්‍යයේ වතු ජනතාවට ඉඩම් අයිතිවාසිකම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම මෙකී තත්ත්වයට හේතු වී ඇති අතර අදාල වතු ආශ්‍රිත බොහොමයක් ඉඩම් කිසිදු සැලකිල්ලකට ලක් නොවී එසේ ම වර්තමානයේ නිෂ්පාදන හෝ වගා කටයුතු සිදු කළ නොහැකිව පවතින අතර, ඇතැම් විට ගම්මාන සඳහා අත්පත් කරගනු ලැබේ. (වගාවන් සිදු කළ නොහැකි)

- ⇨ නිවාස ගොඩනගා ගැනීම හෝ කෘෂිකාර්මික කටයුතු සිදු කරගැනීම සඳහා අවශ්‍ය ඉඩම් වෙත නිත්‍යානුකූල ප්‍රවේශයක් හෝ විකල්ප නිවාස වෙත ප්‍රවේශයක් ඇති නොවන පරිදි වෙනස් කොට සැලකීම්සහගත ආකාරයෙන් , අතහැර දමන ලද කම්කරු ලයින් කාමර වෙත තමන්ව කොටු කරනු ලබන ප්‍රශ්නයක් වශයෙන් බොහොමයක් වතු ජනතාව විසින් ස්වකීය නිවාස ප්‍රශ්නය දකිනු ලබයි

- ⇨ මෙම ගැටළු අතර පවත්නා වඩාත්ම බරපතල කාරණය වන්නේ බොහෝ විට එක් කාමරයක් වශයෙන් පවත්නා මෙම නිවාස ඒකක තුළ සාමාජික සංඛ්‍යාව ඉහළ යාමත් සමග සියලු දෙනාට එකට ජීවත්වීමට සහ නිදාගැනීමට පවා සිදු වීමයි. පරම්පරාවන් දෙකක් ජීවත් වන සහ ඇතැම් අවස්ථාවලදී පරම්පරාවන් තුනක් ජීවත් වන මෙවන් නිවාස ඒකක තුළ පෞද්ගලිකත්වය පිලිබඳ ගැටළු නිර්මාණය වේ. බොහෝ විට අලුතින් විවාපත් වූ, අවිවාහක සහ බරපතල රෝගාබාධ වලට ලක් වී සිටිය හැකි ඇතැම් වැඩිහිටි සාමාජිකයන් හට ද ඉතාම අපිරිසිදු සහ සමාජීය වශයෙන් අප්‍රසන්න තත්ත්වයන් යටතේ එකට ජීවත් වීම හෝ එකම කාමරයක් තුළ අන් අය සමග නිදා ගැනීම සිදු කිරීමට වේ.

- ⇨ තමන් දැනට ජීවත් වන කම්කරු ලයින් කාමර හෝ එම ඉඩම් සඳහා කිසිදු නෛතික හිමිකමක් නොමැතිවීම, ඇතැම් විට ගව මඩු ආදිය ඇතුළුව වැවිලි ප්‍රජාව විසින් ඉදිකර ගැනීමට අවශ්‍ය ඉදිකිරීම් සඳහා වන ඉල්ලීම් වැවිලි බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කිරීම යනාදී ගැටළු නිරාකරණය කිරීම සඳහා ප්‍රබල ප්‍රතිපත්තිමය මට්ටමේ මැදිහත්වීම් අවශ්‍ය වේ.

- ⇨ වර්තමාන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන සෞභාග්‍යයේ දැක්ම ප්‍රකාශනය තුළ දක්වා ඇත්තේ වැවිලි අංශය තුළ සියලු පහසුකම් සහිත කුඩා නිවාස ඉදි කරනු ඇති බවයි. එහෙත් මේ දක්වා මෙම කාරණය යථාර්ථයක් බවට පත් වී නොමැත. මින් පෙර ක්‍රියාත්මක වූ නිවාස යෝජනා ක්‍රම තුළදීද

*වැවිලි අංශය තුළ සේවය නොකරන ජනතාව බැහැර කරන ලදී.* රජය විසින් පර්චස් 7ක ඉඩම් කොටසක් සැපයීමට එකඟ වී ඇති නමුත් පර්චස් 20ක ඉඩමක් ලබා ගැනීම සඳහා දැඩි ඉල්ලුමක් සහ ආන්දෝලනයක් පවතී.

⇨ ඉඩම් හිමිකම ආහාර සහ ආහාර ස්වෛරීත්වය පිළිබඳ හිමිකම හා සමීපව බැඳී පවතී. ලෝක ආහාර වැඩසටහනේ වාර්තාව මගින් අවධාරණය කරනු ලබන පරිදි වැවිලි අංශය තුළ ආහාර අනාරක්ෂිතභාවය සහ මන්දපෝෂණය අතිශයින්ම ඉහළ මට්ටමක පවතී. කෙසේ වුවද, විටින් විට බලයට පත්වූ රජයන්ගේ ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් එසේ සිදු කිරීමට අදාල දේශපාලන ප්‍රකාශ සිදු කොට ඇති නමුත්, මෙම කාරණය මේ දක්වා ප්‍රමාණවත් පරිදි ආමන්ත්‍රණය වී නොමැත.

⇨ වැවිලි බෝග පිළිබඳ සංඛ්‍යා ලේඛන තොරතුරු වලට අනුකූලව භාවිතාවට නොගත් හෝ අත් හැර දමන ලද වතු ඉඩම් ඉතා විශාල ප්‍රමාණයක් (හෙක්ටෙයාර් 40,000කට වඩා) වැවිලි අංශය තුළ පවතින බවට අනාවරණය වී ඇති අතර, ඒ අනුව පර්චස් 7 ක පමණ ඉඩමක් නිවාස ගොඩනගා ගැනීම සඳහාත් ජීවනෝපාය ක්‍රියාකාරකම් සඳහා තවත් පර්චස් 20ක පමණ ප්‍රමාණයකුත් ප්‍රදානය කිරීමේ හැකියාව පවතී. ඒ අනුව, දැඩි ඉඩම් අවශ්‍යතාවය නිසා අසරණව සිටින පවුල් 174,913 ක ප්‍රමාණයක් වෙත බෙදා දීම සඳහා අවශ්‍ය වන්නේ ඉඩම් හෙක්ටෙයාර් 14,576 ක් බවට ඇස්තමේන්තු කෙරේ. එවිට එක් හෙක්ටෙයාරයක් පවුල් 12ක් සඳහා ලබා දිය හැකි අතර, එහිදී අවශ්‍ය ප්‍රවේශය සහිතව පර්චස් 27ක ප්‍රමාණයක් එක් එක් පවුල සඳහා ලබා දෙමින් එක් හෙක්ටෙයාරයක් තුළ පවුල් 15ක් පමණ පදිංචි කරවීමේ හැකියාවක් පවතී. මෙම ක්ෂේත්‍රය තුළ පවත්නා නිවාස ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා මෙය යෝග්‍ය විසඳුමක් බව පෙනී යයි.

## ප්‍රතිපත්තිය / ක්‍රියාත්මක කිරීමේ හිඩැස් (අඩුපාඩු)

- වැවිලි අංශය තුළ ඈපයෙන් බැඳී සිටින ශ්‍රම සැපයුම් ක්‍රමයක් යටතේ ඉතා යටහත් නේවාසික ශ්‍රම බලකායක් පවත්වා ගැනීම සඳහා වැවිලි බලධාරීන් විසින් නිතරම භාවිතා කරන ලද උපායයක් වන බදු කුලී ගෙවීමක් නොමැති ලයින් කාමර ආශ්‍රිත නවාතැන් තුළින් ඇති වන සමාජ ආර්ථික බලපෑම අවබෝධ කර ගැනීම සඳහා ප්‍රබල පර්යේෂණ නොමැති වීම.

- මලයහ දමිල ප්‍රජාව විසින් මුහුණ දෙනු ලබන නිවාස ගැටළුවෙහි සැබෑ තත්ත්වය පිළිබඳ විශ්වසනීය දත්ත නොමැති වීම හේතුවෙන් නිවාස ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති රාමු සහ වැඩසටහන් සැකසුම් කිරීමේදී මෙම ගැටළුවෙහි බරපතලභාවය කෙරෙහි නිසි අවධානය යොමු වී නැත.

- ඉඩම් හිමිකම / නිවාස හිමිකාරිත්වය නොමැති වීම තුළින් නන් වැදෑරුම් මූලික මිනිස් අයිතිවාසිකම් ගණනාවක් තර්ජනයට ලක් වේ. සංවර්ධන කටයුතු සඳහා, ජීවනෝපය සඳහා, ආපදා සහන ලබාගැනීම සඳහා සහ දරිද්‍රතාවය පහළ හෙලීම සඳහා ඉඩම් වෙත ප්‍රවේශය වැදගත් වන අතර, එසේ ම බොහොමයක් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සඳහා මං විවර කරගැනීම සඳහා සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් ගණනාවක් වෙත ප්‍රවේශ වීම සඳහා මෙම හිමිකම බොහෝ විට අවශ්‍ය වේ.

- ඉඩම් හිමිකාරිත්වයක් නොමැති ජනතාවට ගමනාගමන කටයුතු වලදී සහ දේශපාලන ක්‍රියාවලිය තුළ සහභාගි වීමේදී, එම අවස්ථාවන් සීමා කරමින් ඉඩම් හිමිකාරිත්වය සම්බන්ධයෙන් පුරවැසිභාවය හඳුනාගැනීමට ලක් නොවීම. වැවිලි ප්‍රජාව සඳහා ඉඩම් හිමිකාරිත්වය පිළිබඳ පවත්නා අයිතිය දීර්ඝකාලයක් තිස්සේ පැවති ඉල්ලීමක් වී ඇත. දේශපාලන පක්ෂ, සිවිල් සමාජ සංවිධාන සහ විද්වතුන් විසින් වසර ගණනාවක් තිස්සේ ඉඩම් හිමිකාරිත්වය ඉල්ලා සිටින ලදී. පෙර පැවති රජයන් විසින් විශේෂයෙන් ම නිවාස හිමිකාරිත්වය ආශ්‍රිතව ඇතුළුව පොරොන්දු ගණනාවක් ලබා දී ඇති

නමුත් ඒවා මගින් අර්ථාන්විත ප්‍රතිලාභ සලසා ගැනීමකට මෙම ප්‍රජාවන්ට තවමත් හැකියාව සැලසී නැත.

- *"නම් කළ ප්‍රදේශ වල වතු වල ඇති නිවාසයන්හි නිත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාස වල අයිතිය ප්‍රදානය කිරීම සඳහා, එම පදිංචිකරුවනට හිමිකම් ඔප්පු නිකුත් කිරීම පහසු කරලීම" යනුවෙන් අධිකාරියේ කර්තව්‍යයන් වලින් එකක් වශයෙන් ප්‍රකාශ වන* 2018 අංක 32 දරණ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරි පනතේ 6 (ඇ) කොටස ක්‍රියාත්මක නොකිරීම . *වැවිලි ප්‍රජාවන්ගේ යහපත උදෙසා විශේෂයෙන්ම සකස් කරන ලද නීති තුළ අඩංගු වන නෛතික ප්‍රතිපාදන මධ්‍යයේ ඒවාට අදාල කිසිදු පැහැදිලි ප්‍රතිඵලයක් විද්‍යමාන නොවේ.*

## පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග

1. වැවිලි කලාප වශයෙන් නම් කරන ලද ප්‍රදේශ වල ජීවත් වන සියලු මලයහ දමිල ප්‍රජාවන් සහ නිවාස ගැටළුව සම්බන්ධයෙන් ඔවුන්ගේ තත්ත්වයන් ආවරණය වන පරිදි ජාතික මට්ටමේ පර්යේෂණ සිදු කිරීමට

2. 2018 අංක 32 දරණ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරි පනත යටතේ දක්වා ඇති ඉඩම් හිමිකාරිත්වය සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන සාධනය සහ අර්ථාන්විත අයුරින් ක්‍රියාවට නැංවීම

3. නීති ප්‍රතිසංස්කරණ සහ පරිපාලනමය ක්‍රියාමාර්ග ඔස්සේ වැවිලි ප්‍රදේශ වල ඇති සියලුම මානව ජනාවාස පූර්ණ පහසුකම් සහිත ගම්මාන වශයෙන් හඳුනාගැනීමට ලක් කිරීම

4. මලයහ දමිල ප්‍රජාවට නීතිමය හිමිකාරිත්වය සහිතව පැවරිය හැකි ඉඩම් හඳුනාගැනීම සඳහා සුවිශේෂ ප්‍රතිපත්ති රාමුවක් සම්පාදනය කිරීම සහ නිවාස ඉදිකිරීම සඳහා පහසුකම් සැලසීම

5. නිවාස ඉදි කර ගැනීම සඳහා වන ඉඩම් කැබැල්ලක් වශයෙන් ආරක්ෂිත ඉඩම් බුක්තිය වතුවල ජීවත් වන සියලු වැසියන් සඳහා ලබා දෙනු ලබන බව සහතික කිරීමට අවශ්‍ය නීතිමය සහ පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීම. ඒ ආකාරයට ලබා දෙන ඉඩම් පරිමාණය එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශය තුල අනිකුත් පුද්ගලයන් හට ලබා දෙන ඉඩම් හිමිකම් වලට සමාන විය යුතුය. කිසියම් නිවාස ඒකකයක් තුළ සැමියා සහ බිරිඳ වෙත හවුල් හිමිකාරිත්වයක් ලබා දිය යුතුය.

6. වසා දමා ඇති සහ ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින වතු ආශ්‍රිත ඉඩම් නැවත බෙදා දීමේදී වැවිලි කම්කරු පවුල් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම. එලෙස ලබා දෙනු ලබන ඉඩම් පරිමාණය එම ප්‍රදේශයේම අනිකුත් වැසියන් හට නිවාස, කෘෂිකාර්මික හා අනිකුත් ජීවනෝපාය කටයුතු සඳහා ලබා දෙනු ලබන ඉඩම් පරිමාණයට වඩා නොඅඩු විය යුතු අතර, භුක්තියේ ආරක්ෂාව (ඇපය) පැවතිය යුතුය.

7. ඕනෑම ඉඩම් බෙදාදීමක් අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාශය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා සංයුතියට සමානුපාතික විය යුතු අතර එලෙස ඉඩම් බෙදා දීමේදී ඉඩම් නොමැති වැසියන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

8. වසර 10කදී පූර්ණ නිවාස අවශ්‍යතා ප්‍රමාණය සපුරාලීමේ ඉලක්කය සහිතව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුළ විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීම සහ සේවක පවුල් සඳහා ප්‍රධානත්වයක් ආකාරයට හෝ සහනදායී ආකාර මත තනි නිවාස සැපයීම උදෙසා වාර්ෂික අයවැය ඔස්සේ ප්‍රමාණවත් අරමුදල් ඒ සඳහා වෙන් කිරීම. මලයහ දමිල ප්‍රජාව සඳහා නිවාස ඉදි කිරීමට ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික සංවර්ධන සහාය සලසා ගැනීම වෙනුවෙන් වන අවස්ථා ක්‍රියාකාරීව සොයා බැලීම.

9. වැවිලි අංශය තුළ සිටින මධ්‍යම ආදායම් ලබන රජයේ සේවකයන්, ගුරුවරුන් සහ වෙනත් කුඩා කණ්ඩායම් සඳහා විශේෂ නිවාස සහාය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

10. පසුගිය දශක තුන තුළ රජයේ විවිධ යෝජනාක්‍රම යටතේ ඉදි කරන ලද නිවාස 37,000කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම හා එම කටයුතු නියමානුකූල බවට පත් කිරීම

# ළමුන් සහ තරුණයින්

*අභිමතාර්ථය : වැවිලි අංශය තුළ පාසල් හැර යන ළමුන්ගේ ගැටළු සහ තරුණ විරැකියාව පිළිබඳ ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම*

## ප්‍රධාන ගැටළු

- වතු පාසල් රජයේ පාලනය යටතට ගැනීම, සුදුසුකම් සහ පුහුණුව ලත් ගුරුවරුන් පත් කිරීම සහ ප්‍රමාණවත් සම්පත් ආදිය වෙන් කිරීම යනාදිය සම්බන්ධයෙන් පවත්නා වෙනස් කොට සැලකීමක් දක්වන රාජ්‍ය ප්‍රතිපත්ති සහ ඒ ආශ්‍රිතව සිදුවන බැහැර කිරීම හේතු කොට ගෙන මලයහ ජනතාවගේ අධ්‍යාපන මට්ටම ජාතික, සාමාන්‍ය මට්ටමට වඩා පහළින් පවතී.

- විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලකීමේදී ජාතික විශ්ව විද්‍යාල 15 ක් තුළ සිසුන් 100,000 ක් පමණ සිටින අතර, එයින් වැවිලි අංශය නියෝජනය කරනුයේ සිසුන් 2500 ක් පමණි. සෑම වර්ෂයකම මෙම විශ්වවිද්‍යාල වලට සාමාන්‍යයෙන් 40,000ක පමණ ප්‍රමාණයක් ඇතුලත් වන අතර ඔවුන් අතරින් වැවිලි අංශයට අයත් සිසුන් සිටිනුයේ ඉතා ස්වල්පයකි. විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වාර්ෂිකව තෝරා ගනු ලබන්නේ ඔවුන්ගෙන් 500 – 600 අතර ප්‍රමාණයක් පමණක් වන අතර, විද්‍යාව සහ ගණිත අංශ වලින් අධ්‍යාපනය සැලසීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සහිත පාසල් එම අංශය ආශ්‍රිතව නොපවතින බැවින් මෙලෙස තේරෙන සිසුන්ද බොහෝ විට කලා විෂය ධාරාවට සීමා වී සිටී.

- ජාතික සාක්ෂරතා අනුපාතය 92.3% ක් වන නමුත් 2020 වර්ෂයේදී වතු ක්ෂේත්‍රය ආශ්‍රිතව මෙය 85%ක් පමණක් විය. මලයහ දමිළ ප්‍රජාවේ දරුවන් දිගින් දිගටම බැහැර කිරීමට ලක් වීමත්, ඔවුන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණ වැඩි දියුණු කරගැනීම සඳහා කාර්යක්ෂම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමක් නොමැති වීමත් දැනට පවත්නා දත්ත තුලින් පැහැදිලිව විද්‍යාමාන වේ.

- එම නිසා, වතු ප්‍රජාවේ බොහොමයක් සිසුන් අඛණ්ඩවම උසස් අධ්‍යාපන අවස්ථා අහිමි වීමකට ලක් වී ඇත. එයට අමතරව, වඩාත් යහපත් වැටුප් සහිත සුනිසි රැකියා සඳහා අවශ්‍ය වන කුසලතාවයන් යොදා ගැනීම සඳහා වැවිලි සේවකයන්ගේ දරුවන් හට ලියාපදිංචි විය හැකි පාඨමාලා සහිත ඉගැන්වීමේ මාධ්‍යය දමිල භාෂාව වශයෙන් පවත්නා වෘත්තිය පුහුණු ආයතන නොමැත.

- සාධනීය, නවීන, සහ නිසි කලට අදාල විවිධ අංශ ආවරණය වන ප්‍රතිචාර සැපයීමට රජය අපොහොසත් වන්නේ නම්, වැවිලි ප්‍රජාවන්ට අයත් දරුවන් අතරමගදී පාසල් හැර යාමේ අවදානමට පමණක් නොව ළමා ශ්‍රමය සැපයුමට ගොදුරු වීමේ අවදානමටද (ඇපයෙන් බැඳී සිටින ශ්‍රමය ඇතුළුව) මුහුණ දෙනු ලැබේ.

- කාන්තාවන් සහ ගැහැණු ළමුන් වසංගතයට ප්‍රතිචාර දැක්වීම ආශ්‍රිතව ඇතුළුව වෙනස් ආකාරයේ සහ විෂමානුපාතික (නොගැලපෙන) බලපෑම් වලට ලක් වී ඇති අතර, බොහෝදෙනෙකු විසින් මුහුණ දෙනු ලබන දෛනික මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ අපයෝජන තත්ත්වයන් වඩා තීව්‍ර වී ඇත. කොවිඩ් 19 ආශ්‍රිත ගැටළු ද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් මධ්‍යස්ථ නොවන අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අන්තර්කරණයක් සහ සියළු අංශ ආවරණය වන දෘෂ්ඨියක් නොමැති ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඔස්සේ දක්වන කවර හෝ ප්‍රතිචාර තුලින් සිදුවන්නේ කාන්තාවන්ගේ සහ ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් වැඩි දියුණු කිරීම් සම්බන්ධයෙන් ලබාගෙන ඇති සුළු ප්‍රගතිය කෙරෙහි පවා නැවත බාධා ඇති වීමයි.

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පාසල් වසා දැමීමත් සමග ළමුන් රැකවරණය සලසන්නන් වශයෙන් ගෘහ සේවයට යොමු වීමේ මෙන්ම අපයෝජනය, සූරාකෑම සහ ප්‍රචණ්ඩත්වය ආදියට ළමුන් නිරාවරණය වීමේ අවදානමද ඉහළ ගොස් ඇත. තේ දළු නෙලීමෙහි නිරත වන දෙමාපියන් (ඇතැම් පවුල් වල ස්වාමි පුරුෂයින් නොමැති තනි මවුවරුන්) වැඩට යාමත් සමග දරුවන් තම ආරක්ෂාව

තමන්ම සලසා ගනිමින් නිවෙස් වල තනිවීම සිදුවන තත්ත්වයක් යටතේ වඩා ඉහළ අවදානම් පාත්‍රතාවක් සහිත තත්ත්වයකට බොහෝ විට මුහුණපානු ලබන්නේ ගැහැණු දරුවන්ය. ඔවුන් අපයෝජන සහ ප්‍රචණ්ඩත්වය සිද්ධීන්හි වින්දිතයන් මෙන්ම සාක්ෂිකරුවන් බවටද පත් වන අතර, හුදෙක් කොවිඩ් වෛරසයට නිරාවරණය වීමේ අවදානම හේතුවෙන් පමණක් නොව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කාර්යක්ෂම සහ වගකීම් සහගත සේවා හා යාන්ත්‍රණ නොමැති වීම හේතුවෙන්ද ඔවුන් කම්පන තත්ත්වයන්හි ගොදුරු බවට පත් වේ.

⇨ එම නිසා ළමයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සිදු වන සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන අතරතුර සියලු ළමයින් සුරාකෑම සහ අපයෝජනයෙන් ආරක්ෂා වන බව සහතික කිරීම සඳහා ළමා ආරක්ෂණ අධිකාරීන් ඔස්සේ රජය විසින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. පහත දක්වා ඇති වගුව තුලින් මලයහ දෙමළ ප්‍රජාව අතර පවත්නා අධ්‍යාපන අංශයට අදාල ගැටළුවෙහි බරපතලභාවය පෙන්නුම් කරනු ලැබේ.

**වැවිලි ක්ෂේත්‍රය තුළ අධ්‍යාපන මට්ටම 2017/18**

| දර්ශක | ජාතික | නාගරික | ග්‍රාමීය | වතු |
|---|---|---|---|---|
| වැඩිහිටි සාක්ෂරතාවය | 91.4 | 94.6 | 91.8 | 74.3 |
| පාසල් අධ්‍යාපනයක් නොලද | 3.1 | 2.2 | 3.0 | 8.3 |
| 5 ශ්‍රේණිය දක්වා | 21.1 | 15.9 | 21.5 | 35.5 |
| 6-10 ශ්‍රේණි සමත් | 44.0 | 39.6 | 44.0 | 44.0 |
| සා.පෙල සමත් | 16.7 | 19.2 | 16.7 | 8.6 |
| උ.පෙල සමත් | 12.2 | 18.2 | 11.4 | 3.3 |
| සමත් ප්‍රතිශතය | 2.8 | 4.9 | 2.4 | 0.3 |
| අධ්‍යාපන ක්‍රියාකාරකම් වල නිරත නොවන – වයස 5-14 (%) | 4.2 | 4.5 | 3.9 | 7.2 |
| පරිගණක සාක්ෂරතාවය (%) | 24.2 | 36.8 | 22.1 | 8.8 |
| අධ්‍යාපනය සඳහා වන මාසික වියදම (ශ්‍රී.ලං.රු) | 2401 | 4130 | 2114 | 948 |
| ජ්‍යෙෂ්ඨ පාසල් සඳහා ලියාපදිංචිය (%) | 80.6 | 86.2 | 81.4 | 53.8 |
| උසස් පාසල් සඳහා ලියාපදිංචිය (%) | 39.4 | 45.8 | 39.7 | 12.8 |

මූලාශ්‍රය : කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණ වාර්තාව, *2019*

⇨ රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත වතු තුළ ජීවත් වන ළමයින් අතර පවත්නා බරපතල ගැටලුවක් වනුයේ පාසල් හැර යාමයි. අඛණ්ඩව පවත්නා දරිද්‍රතාවය හේතුවෙන් සහ රට තුළ අවම ආදායම් ලබා ගන්නා පාර්ශ්වය වීම හේතුවෙන් දෙමාපියන් හට දරුවන්ගේ අධ්‍යාපන වියදම් කළමනාකරණය කර ගැනීමට නොහැකි අතර මෙම රටාව පසුගිය වසර 10 තිස්සේ සැලකිය යුතු අයුරින් ඉහළ ගොස් ඇත.

⇨ වතු පාසල් වල බොහෝ විට පංති පැවැත්වෙන්නේ ප්‍රාථමික ශ්‍රේණි සඳහා පමණි. දරුවන් වතු පාසල් වල සිට අසල නගර වල තිබෙන ද්විතියික පාසල් වලට මාරු කිරීමට අදාලව දැරිය යුතු වන පිරිවැය හේතුවෙන් පමණක් නොව ප්‍රදේශ වල පවත්නා දුර්වල පොදු ප්‍රවාහන සේවාවන් හේතුවෙන්ද එලෙස මාරු කිරීම අපහසු වී ඇත.

⇨ වතු තුළ පවත්නා පාසල් සහ යාබද නගර වල පවත්නා ද්විතියික පාසල් තුළ මනා සුදුසුකම් සහිත ගුරුවරුන් නොමැති වීම, විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය සඳහා පහසුකම් නොමැති වීම, රසායනාගාර පහසුකම් සහ ක්‍රීඩාංගන ආදිය නොමැති වීම යනාදිය හේතුවෙන් බොහෝ අඩුපාඩු වලට ලක් වී ඇත.

⇨ ලයින් නිවාස ආශ්‍රිතව පවත්නා තදබදය, පවුලේ සාමාජිකයන්ගෙන් සහ අසල්වැසියන්ගෙන් ඇති වන බාධාවීම් ආදිය නිසා වතුකර ළමුන් හට ස්වකීය පාසලෙන් දෙන ලද වැඩකටයුතු වල වල නිරත වීමේ හැකියාවක් නොමැති අතර, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇතුළුව මත්පැන් භාවිතය හේතුවෙන් ඇති විය හැකි බාධාවන්ද මෙම තත්ත්වය සඳහා හේතු වේ.

- ⇨ එක් අතකට වතු ආශ්‍රිතව සුරක්ෂිත රැකියා අවස්ථා අඩු වීම සහ අනෙක් අතට තරුණයින් අතර වතු ආශ්‍රිත කම්කරු වැඩ සඳහා අකමැත්තක් පැවතීම මෙම තත්ත්වය සඳහා තුඩු දී ඇත. මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව දිගින් දිගටම පවත්නා ගැටලුවක් වන්නේ මලයහ දමිල ප්‍රජාවේ තරුණයින් අධ්‍යාපනික වශයෙන් සුදුසුකම් ලබාගන්නා තත්ත්වයක් මධ්‍යයේ වුවද, වතු පාලනාධිකාරිය විසින්, ඔවුන් සතුව දීර්ඝකාලීනව පැවති අගතිගාමී මානසිකත්වයන් හේතුවෙන්, වතු ජනතාවගේ දරුවන් හට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පවතිද්දී කාර්යාල රාජකාරි සඳහා සහ ඉහළ මට්ටමේ නිරීක්ෂණ කටයුතු සඳහා එම ප්‍රජාවේ දරුවන් බඳවා ගැනීම හිතාමතාම මග හරිනු ලැබීමයි.
- ⇨ වතු අංශය තුළ තරුණයින් අතර පවත්නා විරැකියාව : වැවිලි අංශයේ තරුණයින් ඉහළ සංඛ්‍යාවක් බොමොහයක් නුපුහුණු ශ්‍රම සැපයීම, සුදුසුකම් වලට නොගැලපෙන අඩු මට්ටමේ රැකියා වල නිරත වීම සහ අඩු වැටුප් සහිත පෞද්ගලික ආයතනවල සේවා නියුක්ත වීම දැකගත හැකි අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු සේවය කරනුයේ ඉතාම ඛේදජනක තත්ත්වයන් යටතේය. සමස්තයක් වශයෙන් ගත් කළ, හැකියාවන් සහ පවත්නා රැකියා අතර ඇති නොගැලපීම හේතුවෙන්, විරැකියාව වැවිලි අංශයේ තරුණයින් අතර වැඩි වැඩියෙන් ඉස්මතු වන ගැටලුවක් බවට පත් වී ඇත.

## ප්‍රතිපත්තිය / ක්‍රියාත්මක කිරීමේ හිඩැස් (අඩුපාඩු)

- වැවිලි අංශය තුළ දමිළ මාධ්‍ය අධ්‍යාපනය සඳහා පවතින අවස්ථා සීමාසහිත වීමේ දිග්ගැස්සුණු ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති මට්ටමේ තීරණ නොමැති වීම.

- වතු ආශ්‍රිත දරුවන් අධ්‍යාපනය ලබන පාසල් වල දිගින් දිගටම පවත්නා පහසුකම් වල අඩුපාඩු ආමන්ත්‍රණය කිරීම සඳහා මධ්‍යම රජයේ සිට පලාත් රජයයන් දක්වා නිසි සම්පත් වෙන් කිරීමක් සිදු නොවීම.

- මලයහ දමිල ප්‍රජාවේ දරුවන් හට තම ප්‍රදේශ වලින් බැහැර වඩා වැඩි පහසුකම් සහිත පාසල් තුළ ද්විතියික අධ්‍යාපන අවස්ථා සලසා ගැනීමේ අවස්ථාවන් සීමා වීමට තුඩුදෙමින්, වැවිලි අංශය තුළ පවත්නා ප්‍රවාහන පහසුකම් සහ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීමේ ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා නිසි අයුරින් ක්‍රියාවට නැංවිය හැකි ක්‍රමවේද සහිතව නිත්‍ය විසඳුම් නොමැතිවීම.

- අධ්‍යාපනය යන කාරණාව සැලකිල්ලට ගැනීමේදී, වැවිලි අංශයේ තරුණයින් හට නිසි තාක්ෂණික දැනුම, වෘත්තිය සුදුසුකම් සහ මාර්ගෝපදේශකත්වය සැපයීම සඳහා කාර්මික විද්‍යාල නොපැවතීම ඔවුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සැලකීමේදී විශාල අඩුපාඩුවක් ලෙස පෙනෙන්නට තිබේ. ඉතා දීර්ඝ කාලයක් තිස්සේ ඔවුනට පුරවැසිභාවය පිළිබඳ හිමිකම් අහිමි වී තිබූ බැවින් 1980 අගභාගය දක්වාම රාජ්‍ය අංශයේ ප්‍රමාණවත් රැකියා අවස්ථා සලසා ගැනීමට ඔවුනට හැකියාවක් නොපැවතුණි. නම් වශයෙන් ගත් විට පළාත් සේවාවන්, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථා ඇතුළුව රාජ්‍ය අංශය තුළ ඔවුන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතය පිලිවෙලින් එකී ආයතන සඳහා 0.1%, 0.2% සහ 0.5% වේ.

- කම්කරු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පුහුණුව හෝ වෘත්තිය අධ්‍යාපන පහසුකම් නොමැති වීම. හැටන් ප්‍රදේශයේ පිහිටා ඇති තොණ්ඩමන් කාර්මික විද්‍යාලය මගින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැවිලි අංශයට අදාල තරුණයින් සඳහා පමණක් යම් කාර්මික පුහුණුවක් සලසනු ලැබේ. මෙම ආයතනය මගින් ශ්‍රම වෙළඳපොල අවශ්‍යතාවයන් සපුරාලීමට ප්‍රමාණවත් පරිදි කාර්මික පුහුණු අවස්ථා සැලසීමක් සිදු නොවන නමුත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් නොපවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් අද වන විට විරැකියාව වැවිලි අංශයේ තරුණයන් අතර ප්‍රබල සමාජ ගැටළුවක් බවට පත් වී ඇත.

## පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග

1. නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොනරාගල, කෑගල්ල, රත්නපුර, කළුතර සහ අවිස්සාවේල්ල කලාප ආශ්‍රිතව ජාතික පාසල් 10ක් ස්ථාපිත කිරීම හෝ පවත්නා ජාතික පාසල් වල තත්ත්වයන් වැඩි දියුණු කිරීම ඔස්සේ වැවිලි අංශය තුළ සහ ජාතික මට්ටමේ අධ්‍යාපනික ජයග්‍රහණ ලබා ගැනිම ආශ්‍රිතව පවත්නා සැලකිය යුතු විෂමතාවයන් අඩු කිරීමට හා පිටුදැකීමට ක්‍රියාමාර්ග ගැනීම
2. විද්‍යාව / ගණිතය / තාක්ෂණය යන විෂය ධාරාවන් සහිතව සහ වැවිලි අංශයේ දරුවන්ට ප්‍රවේශ හැකියාව සහිතව මෙම කලාප ආශ්‍රිතව පූර්ණ පහසුකම් සහිත අධ්‍යාපන මධ්‍යස්ථාන වශයෙන් මෙම ජාතික පාසල් සංවර්ධනය කිරීම.
3. භෞතික සහ මානව සම්පත් සැලකීමේදී අනෙකුත් පාසල් හා සමාන තත්ත්වයක් ඇති වන සේ වැවිලි කලාපය තුළ ඇති ප්‍රාථමික පාසල් වල ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම.
4. වැවිලි අංශය තුල සියලු පාසල් වල ක්‍රීඩාංගන, පුස්තකාල සහ තොරතුරු තාක්ෂණ රසායනාගාර ඇතුළුව භෞතික සම්පත් වෙන් කිරීම හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම .
5. දරුවන් සහ විශේෂයෙන්ම නව යොවුන් වියේ පසුවන ගැහැණු දරුවන්ගේ අවශ්‍යතා සැපිරෙන පරිදි වැවිලි ක්ෂේත්‍රය තුළ පොදු ප්‍රවාහන සේවාවන් ක්‍රියාත්මක වන වාර ගණන සහ ඒවායේ තත්ත්වය වැඩි දියුණු කිරිම
6. මධ්‍යම සහ ද්විතියික මට්ටම් ආශ්‍රිතව විශේෂයෙන්ම විද්‍යාව සහ ගණිතය විෂය ධාරාවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් ගුරුවරුන් සංඛ්‍යාව බඳවා ගැනීම සහ ඒ අතරතුර ද්විපාර්ශ්වික / බහු පාර්ශ්වික සංවර්ධන සහයෝගය සලසා ගනිමින් කෙටි කාලීන අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වීම සහතික කිරීම
7. වැවිලි ප්‍රදේශ නියෝජනය කරමින් දෙමළ මාධ්‍යයෙන් උපාධි ලබා ගන්නා පිරිමි සහ ගැහැණු ළමුන් අතර සමානව බෙදී යන පරිදි විශේෂයෙන්ම ඉංජිනේරුවේදය, වෛද්‍ය විද්‍යාව සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විෂය ධාරා ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන වැඩසටහන් සහ ප්‍රතිජානන වැඩසටහන් වැවිලි අංශයේ සිසුන් සඳහා හඳුන්වා දීම
8. කඳුරට දමිළ ප්‍රජාවගේ විශේෂ අවශ්‍යතා වෙනුවෙන් විශේෂයෙන්ම වෙන්වූ එසේම අමතර පූර්ණ පහසුකම් සහිත අධ්‍යාපන විද්‍යා පීඨයක් සහ ගුරු පුහුණු පාසලක් , කුසලතා සංවර්ධන සහ වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන මෙන්ම ජාතික විශ්ව විද්‍යාලයක් හැටන් ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.
9. කාර්මික සහ වෘත්තීය පාඨමාලා කඳුරට තරුණ තරුණියන් යන දෙපාර්ශ්වයටම ප්‍රවේශ විය හැකි තත්ත්වයට පත් කිරීම - මෙය සිදු කළ යුතු වන්නේ කාර්මික විද්‍යාල තුළ දමිළ මාධ්‍යයෙන් වැඩිපුර පාඨමාලා ප්‍රමාණයක් පැවැත්වීම මගින් සහ අවාසියට ලක් වී සිටින තරුණයින් සඳහා විශේෂ ප්‍රවේශ නිර්ණායක සකස් කිරීම සහ ඉලක්කගත වැඩසටහන් ස්ථාපිත කිරීම තුළිනි. ඔවුන්ගේ පුළුල් ප්‍රවේශ වීම සහ සහභාගිත්වය දිරිගන්වනු වස් රැකියා උපදේශනය, සේවාස්ථ පුහුණු අවස්ථා සහ වැටුප් ලබා දීම ආදිය සලකා බැලිය හැකිය.
10. ජනගහනයට සරිලන පරිදි නිසි නියෝජනය සහතික කිරීම සඳහා රාජ්‍ය සේවාවන් තුළ සුළු රැකියා කාණ්ඩ සඳහා සුදුසුකම් ලත් කඳුරට දමිළ කාන්තාවන් සහ පිරිමින් ඇතුලත් කිරීම සඳහා අනුග්‍රහපූර්ව ක්‍රියාමාර්ග වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
11. අගනුවර වෙත සංක්‍රමණය වී අඩු වැටුප් සහිත නුපුහුණු සහ අවිධිමත් රැකියා වලට යොමු වී එක තැන පල් වන කඳුරට තරුණයින් සඳහා වෘත්තිය මාර්ගෝපදේශනය සැපයීමටත් ඔවුන්ගේ වෘත්තිය සහ නායකත්ව කුසලතා වැඩි දියුණු කිරීමටත් වෙන් වූ මධ්‍යස්ථානයක් කොළඹ ප්‍රදේශයේ ස්ථාපිත කිරීම

12. මලයහ ප්‍රජාවේ තරුණයින් හට ඉහළ මට්ටමේ රැකියා වලට පිවිසීමට හැකි වන පරිදි තේ නිෂ්පාදනය සහ සැකසුම් කිරීම ආශ්‍රිත තාක්ෂණය පිළිබඳව විධිමත් පුහුණුව සහ දැනුම ලබා ගැනීමට හැකි වන මාර්ග විවෘත කර දීම- නුවරඑළිය සහ බදුල්ල ප්‍රදේශ ආශ්‍රිතව තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ ජාතික සහ ජාත්‍යන්තර තාක්ෂණික සේවා සපයන්නන් සමග බැඳුණු තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ කුඩා පරිමාණ ව්‍යාපාරයන් සඳහා සහාය සලසන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ක්‍රියාකාරීන් සමග සහයෝගිතාවය සහතික කිරීම

## වතු සේවකයින් සහ අවිධිමත් සේවකයින්

*අභිමතාර්ථය : වැවිලි ප්‍රජාවන් ආශ්‍රිත වතු සේවකයන් සහ අවිධිමත් සේවකයන් යන දෙපාර්ශ්වයේ අද්විතීය අවශ්‍යතා සහ ඔවුන් මුහුණ දෙන අභියෝග ආමන්ත්‍රණය සඳහා වන ප්‍රතිපත්ති නිර්දේශ*

### ප්‍රධාන ගැටළු

- ⇨ උඩරට සේවකයන්ගෙන් සියයට 80ක් පමණ ප්‍රමාණයක් වසංගතය හේතුවෙන් ඇති වූ බාධාවන් නිසා ස්වකීය වතු වෙත නැවත පැමිණෙන ලදී. මින් සියයට 30 සිට 40 දක්වා ප්‍රමාණයක් රැකියා වියුක්තව සිටින අතර ඔවුන් යැපෙන්නන් බවට පත් වී ඇත. කොවිඩ් 19 වසංගතය ආරම්භයේදී සහ ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ප්‍රජාව බරපතල ආර්ථික අපහසුතාවයන්ගේ බලපෑමට ලක් වූ අතර, ස්වකීය දරුවන්ට අවශ්‍ය ආහාරපාන සපයා ගැනීම, මාර්ගගත අධ්‍යාපනය සැලසීම සහ ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීම සම්බන්ධයෙන් අසීරුතාවයන් ඇති වී ඇත.

- ⇨ සුභසාධන සේවා සැපයීම, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සැපයීම සහ අනෙකුත් ද්‍රව්‍යමය වාසි සැලසීම තුලදී පෞද්ගලීකරණයට ලක් වූ වැවිලි කළමනාකාරිත්වය විසින්, රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත වැවිලි සමාගම් විසින් සහ රජයේ ආයතන විසින් වතු නොවන සේවකයන් බැහැර කිරීමට ලක් කරනු ලැබේ. වතු සේවකයන් නොවන පිරිසෙන් සැලකිය යුතු ප්‍රමාණයක් යාබද ගම් වලට, එළවළු වගා බිම් වලට, ඉදි කිරීම් ක්ෂේත්‍ර වෙත සහ තදාසන්න ප්‍රදේශ වෙත යොමු වෙමින් තාවකාලික රැකියා වල නිරත වෙමින් දෛනික වැටුප් ලබා ගනී. (සංක්‍රමණික සේවකයන් වශයෙන්) 50,000කට වඩා වැඩි තරුණයින් ප්‍රමාණයක් පිටකොටුව ප්‍රදේශයේ වෙළඳ සහ ව්‍යාපාරික කටයුතු වල නිරත වීම ඇතුළුව කොළඹ ප්‍රදේශයේ විවිධ අංශ ආශ්‍රිතව රැකියා කරන බව ඇස්තමේන්තු කොට ඇත. එහෙත් ඔවුන් බොහෝ විට සූරාකෑමට ලක් වන අතර ගෙවනු ලබන්නේ ප්‍රමාණවත් නොවන වැටුපකි.

- ⇨ සේවකයන් හට ස්වකීය ජීවනෝපායයන් අහිමි වී තිබෙන අතර වතු හැර දමා යා යුතු තත්ත්වයක් හෝ කුසගින්නේ, උග්‍ර දරිද්‍රතාවයේ හෝ බලාපොරොත්තු සුන් වීමේ තත්ත්වයක රැඳී සිටීමට ඔවුනට සිදුවී ඇත. වතු කළමනාකාරිත්වය විසින් අත් හැර දමන ලද ඉඩම් වල පවා ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වල නිරත වීමට මෙම සේවකයන් හට ඉඩ සලසනු නොලැබේ. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කොළඹ සිට නැවත වතු ප්‍රදේශ බලා පැමිණි තරුණයින් විසින් ස්වකීය ජීවනෝපාය මාර්ග සකසා ගැනීමට අත් හැර දමන ලද ඉඩම් භාවිතා කිරීමට උත්සාහ කරන ලද නමුත් වතු කළමනාකාරිත්වය විසින් ඔවුනට එසේ කිරීමට අවසර ලබා නොදෙන ලදී.

- ⇨ ව්‍යාපාර කටයුතු සහ සංචාරක කටයුතු සඳහා ඉඩම් අල්ලා ගැනීම ඉහළ යමින් පවතී. නිසි නඩත්තුවක් නොමැති වීම සහ ඉතා විශාල භූමි ප්‍රදේශ භාවිතාවට නොගැනීම නිසා බාහිර පාර්ශ්වයන් විසින් විවිධ ප්‍රයෝජන සඳහා මෙම වතු ඉඩම් අල්ලා ගෙන ඇත. මෙරට පුරවැසියන් වශයෙන් මෙම සේවකයන් හට ඉඩම් අයිතිය හිමි වුවත්, දශක ගණනාවක් තිස්සේ ඔවුනට මෙම අයිතිය ලබා දීම ප්‍රතික්ෂේප වී ඇත.

⇨ ප්‍රාදේශීය වශයෙන් බලපෑම් සහගත පුද්ගලයන් දේශපාලනඥයන්ගේ සහයෝගය සහිතව ඉඩම් අල්ලා ගනු ලබන අතර, වතු කළමනාකාරිත්වය හෝ ඉහළ පරිපාලනය යන අංශයන් විසින් ඒවාට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ග ගැනිමක් සිදු නොවේ. ඇතැම් බලවත් දේශපාලනඥයින්හට සංචාරක කර්මාන්තය ඇතුළු විවිධ භාවිතාවන් සඳහා රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත වැවිලි ප්‍රදේශතුළ පවත්නා භාවිතාවට නොගත් ඉඩම් අල්ලා ගැනීමේ අවශ්‍යතාවය පවතී.

⇨ වෘත්තීය සමිති වල අකාර්යක්ෂම ස්වභාවය හේතු කොටගෙන වැටුප් ආශ්‍රිත ගැටළු, සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් වැනි සුභසාධන ගෙවීම්, දෛනික වැඩ සඳහා අදාල වන සම්මත තත්ත්වයන් තීරණය කිරීම, තේ වතු එලි පෙහෙලි කිරීම, පොහොර සහ රසායන ද්‍රව්‍ය නිසි කලට යෙදීම යනාදිය ආශ්‍රිතව කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය වීම නිරන්තරයෙන්ම සිදු වේ. ඇතැම් අවස්ථාවලදී නිතිපතා වැටුප් ලබා දීමක් පවා සිදු නොවේ. වතු ආශ්‍රිතව වැඩ කරන සේවකයන් හට ස්වකීය සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ප්‍රදාන ලබාගැනීමට ඇති ඉඩකඩ අවමය.

## ප්‍රතිපත්ති / ක්‍රියාත්මක කිරීමේ හිඩැස් (අඩුපාඩු)

- ජාතික වශයෙන් ස්ථාපිත කරන ලද කම්කරු නීති සහ ප්‍රතිපත්ති භාවිතාවට ගැනීමක් සිදු නොවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැවිලි ක්ෂේත්‍රය තුළ ඉතා ඛේදනීය වාතාවරණයන් නිර්මාණය වී ඇත. වැසි වනාන්තර, එතිකල් ටී පාට්නශිප් සහ ෆෙයාර් ට්‍රේඩ් සංවිධාන ඇතුළුව ජාත්‍යන්තර ගිවිසුම් සහ සහතිකකරණයන් කිහිපයකම කොටස්කරුවන් වශයෙන් වැවිලි සමාගම් ක්‍රියා කළද, මෙම සහතිකකරණයන්ගේ ප්‍රධාන සංරචක පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමක් සිදු නොවේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ඇතැම් සම්මුතින් තුලින් සුනිසි වැඩවල වැදගත්කම අවධාරණය කරනු ලබන නමුත් ඒවා පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමක් සිදු නොවන අතර, වැවිලි සේවකයන්ගේ සේවා වාතාවරණයන් වැඩි දියුණු කිරීම සඳහා මේවා ක්‍රියාත්මක කරනු ලබන බවට සහතික කිරීමට ඇත්තේ ඉතාම දුර්වල නියාමන යාන්ත්‍රණයකි.

- ජාතික වශයෙන් ස්ථාපිත කරන ලද කම්කරු නීති සහ ප්‍රතිපත්ති භාවිතාවට යොදා නොගැනීම : ජීවත් වීමට සරිලන වැටුප යන්න කෘෂිකර්මය ඇතුළු සියලු අංශ වලදී පිලිගනු ලබන විශ්වීය සංකල්පයකි. එහෙත්, ශ්‍රී ලංකාව සැලකීමේදී වැවිලි සේවකයන් හට ජීවත් වීමට සරිලන වැටුපක් ලබා දෙනු නොලබන අතර රටෙහි ජීවන වියදම් දර්ශකය සහ ස්වකීය වැටුප් අතර විශාල විෂමතාවයක් පවතී.

- ජාතික වශයෙන් ස්ථාපිත කරන ලද සේවා ස්ථානවල ආරක්ෂාව/ සනීපාරක්ෂාව / ස්වස්ථතාව පිළිබඳ රෙගුලාසි භාවිතාවට යොදා නොගැනීම. මෙම කර්මාන්තය 65%කට වඩා සමන්විත වන්නේ කාන්තා සේවිකාවන්ගෙන් වන නමුත් මෙම වගා බිම් ආශ්‍රිතව වැසිකිලි සඳහා පහසුකම් නොපවතින අතර වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පවතින්නේ ඉතා ඛේදනීය මට්ටමකයි. ඔවුන්ට කිසිදු විවේකයකින් තොරව පැය 8කට වඩා වැඩි කාලයක් වැඩ කිරීමට බලපෑම් කෙරෙන අතර මවුවරුන්හට මවු කිරි දීම සඳහා පවා ප්‍රමාණවත් කාලයක් ලබා දෙනු නොලැබේ.

## පුළුල් ප්‍රතිපත්ති කතිකාවතක් සඳහා යෝජිත ක්‍රියාමාර්ග

1. සේවකයන් සඳහා ජීවත් වීමට සරිලන වැටුපක් සහතික කිරීම මෙම පවුල් වල ජීවනෝපාය පිළිබඳ ගැටළුවට තිරසර විසඳුමක් වශයෙන් වැවිලි සේවකයන් කුඩා වතු හිමියන් බවට පරිවර්තනය කරනු ලබන ආකාරයෙන් මෙම කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීම. කුඩා වතුහිමියන්ගේ නිෂ්පාදනය සමාගම් විසින් මිලදී ගැනීම තුළදී ඇති විය හැකි අහිතකර බලපෑම් ආමන්ත්‍රණය කිරීම සහ වැවිලි සේවකයන්ගේ සේවා නියුක්තිය සහ ආදායම් පිළිබඳ සුරක්ෂිතතාවය සහතික කිරීම.

2. රජය විසින් වඩා ශක්තිමත් කම්කරු දෙපාර්තමේන්තුවක් ඔස්සේ රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් මෙන්ම පෞද්ගලික සමාගම් මගින් ද ආගමනය කරනු ලබන කම්කරුවන් ආශ්‍රිත ක්‍රියා පිළිවෙත් දැඩිව අධීක්ෂණයට ලක් කිරීමත් ඒ ඔස්සේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා වීම සහතික කිරීමත් අවශ්‍ය වේ. දැනට කම්කරු නීති ඔස්සේ සේවකයන් සඳහා සැලසෙන ආරක්ෂාවන් ඒ ආකාරයෙන් ආරක්ෂිතව පවත්වාගත යුතුය.

3. ප්‍රතිලාභීන් විසින් සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් සහ විශ්‍රාම වැටුප් නැවත ලබාගැනීම සම්බන්ධයෙන් වඩා පාරදෘශ්‍ය, පරිශීලක මිතුරු සහ වඩා කාර්යක්ෂම ක්‍රියාවලියක් හඳුන්වා දීම.

4. ඉඩම් හිමිකම් සහ රජයේ සේවාවන් වෙත පවත්නා අනිකුත් හිමිකම් මෙන්ම උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන අවතැන්වූ මලයහ දමිල ප්‍රජාවට අවශ්‍ය සහාය සැලසීම යනාදී කාරණා කිසිදු වෙනස්කොට සැලකීමකින් තොරව ඉටු වන බවට සහතික කිරීම.

5. මලයහ දමිල ප්‍රජාව විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු කරන අතිවිශාල දායකත්වය සහ ඔවුන් මුහුණ දෙනු ලබන ව්‍යුහාත්මක බැහැර කිරීම් ප්‍රසිද්ධියේ පිළිගැනීමට ලක් කිරීම

6. ලිංගික හිංසනයෙන් තොර සහ කාන්තා සේවිකාවන් සඳහා සම වැටුප් සහිත සේවා ස්ථාන පරිසරයක් සහතික කිරීම. දේශීය සේවකයන්ගේ සහ අවිධිමත් අංශ සේවකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නෛතික සහ පරිපාලන ක්‍රියාමාර්ග හඳුන්වා දීම

7. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනතේ 2 වන වගන්තිය පරිදි සහ 2007 අංක 7 දරණ පනත මගින් සංශෝධිත 1982 අංක 17 දරණ සමාගම් පනතේ 15(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයක් මගින් සංස්ථාගත කරන ලද වැවිලි සමාගම් වල ගිවිසුම් හෝ අදාල පරිදි කිසියම් නිශ්චිත කාලසීමාවක් සඳහා හඳුනාගනු ලැබූ තේ , රබර් සහ පොල්වතු කළමනාකරණය සඳහා 1958 අංක 4 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම් පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමග දීර්ඝ කාලීනව එළඹී ඇති බදු ගිවිසුම් ප්‍රකාරව, කම්කරු ප්‍රමිතීන් වලට ඒවා අනුකූල වීම පිළිබඳ තක්සේරු කිරීම උදෙසා සමාලෝචනයට ලක් කළ යුතු වේ.

8. මලයහ දමිල ප්‍රජාවන්හට සහ සැලකිල්ලක් දක්වන වෙනත් පාර්ශ්වයන්හට සමාජ, ආර්ථික සහ සංස්කෘතික මෙන්ම සිවිල්, දේශපාලනික සහ අනෙකුත් සියලු හිමිකම් ආශ්‍රිත පැතිකඩ ඔස්සේ පවතින තම ගැටලු, දුක් ගැනවිලි සහ අසාධාරණකම් ඉදිරිපත් කිරීම සඳහා වන අවකාශය සහතික කරමින් ස්වාධීන කොමිෂන් සභාවක් පත් කිරීම- මේ තුලින් අරමුණු කළ යුත්තේ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ වර්තමාන තත්ත්වය පිළිබඳ යම් සමස්ත තක්සේරුවක් සිදු කිරීම, මෙම ප්‍රජාවන්ගේ මර්ධනයට හේතු විය හැකි ප්‍රතිපත්තිමය, ව්‍යුහාත්මක, සමාජ භාවිතාවන් ආශ්‍රිත සහ පරිපාලනමය ආශ්‍රිත බාධකයන් තක්සේරු කිරීම සහ නෛතික ප්‍රතිසංස්කරණ, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ පිළිවෙත් ආශ්‍රිත යෝග්‍ය ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමට සහ වලංගුභාවයට පත් කිරීම සඳහා වඩාත් පුළුල් සාකච්ඡාමය ක්‍රියාවලියක් සැකසුම් කිරීමයි.